0112 690790.

Duty Lists

පොදු චක්‍රලේඛ අංක 1378

ලිපි ගොනු අංකය PA/DDG(PHS)/DN/IC/03/2010
සෞ.සේ.අ.ජ. කාර්යාලය
2010.09.01

## මහජන සෞඛ්‍ය හෙද සොයුරියන්ගේ රාජකාරී ලැයිස්තුව

මහජන සෞඛ්‍ය හෙද සොයුරියගේ ප්‍රධාන කාර්යභාරයන් පහත දැක්වෙන පරිදි වේ.

- අදාල ප්‍රදේශයන්හි සෞඛ්‍ය කටයුතු සැලසුම් කිරීම හා සංවිධානය කිරීම
- අදාල ප්‍රදේශයන්හි පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණීන්ගේ කාර්යභාරයන් සඳහා මඟ පෙන්වීම අධීක්ෂණය හා ඇගයීම.
- මාතෘ හා ළමා සෞඛ්‍ය සහ පවුල් සැලසුම් කාර්යභාරයන් හා ඊට අදාල ජාතික සෞඛ්‍ය තොරතුරු පද්ධතිය අධීක්ෂණයට හා ඇගයීමට ලක් කිරීම.
- කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව.
- විශේෂිත සේවාවන් සැපයීම.
- සරල පර්යේෂණ.
- සෞඛ්‍ය ප්‍රවර්ධනය, රෝග නිවාරණය සඳහා අවශ්‍ය සේවාවන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම

## 01 රාජකාරී අවශ්‍යතාවයන්

රාජකාරී වේලාව

i.සතියේ දිනවල පෙ.ව 8.00 - ප.ව 4.00 සේවා අවශ්‍යතාවය මත සමහර වේලාවන් වෙනස් විය හැක.

සෙනසුරාදා ඉරිදා සහ රජයේ නිවාඩු දිනයන්හි සේවා අවශ්‍යතා මත රාජකාරි කිරීමට සිදුවිය හැක

ii වැඩ කරන සියළුම කාලය තුල නියමිත සම්පූර්ණ නිල ඇඳුමින් සැරසී සිටිය යුතුය

iii සිදු කරනු ලබන සියළුම කටයුතු ඇතුලත් දින පොතක් පවත්වා ගෙන යා යුතු අතර එය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාට ඉදිරිපත් කර පරීක්ෂාවට ලක් කරගෙන නියමිත පරිදි අත්සන ලබාගත යුතුය

iv නියමිත ස්ථානයක (සෞ.වෛ.නි කාර්යාලයේ) තම කාර්යාලය පවත්වාගෙන යා යුතු අතර අවශ්‍ය අවස්ථාවන්හි එය අධීක්ෂණ නිලධාරීන්ගේ පරීක්ෂාවට ලක් කිරීමට හැකි විය යුතුය.

(v) මහජන සෞඛ්‍ය සෙද සොයුරියගේ වාර්තා නියම කර ඇති පරිදි පිළියෙල කර තැබිය යුතුය.

බිත්ති පුවරුව

1 කොට්ඨාශයේ සිතියම
2 අනුමත ඉදිරි වැඩසටහන
3 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියගේ තොරතුරු
4 ජීව සංඛ්‍යාති – වාර්ෂික ඇස්තමේන්තු ඉලක්ක ගණන
5 කොට්ඨාශයේ සායන ලැයිස්තුව
6 පවුල් සෞඛ්‍යයට අදාල ප්‍රස්තාර
7 වාර්ෂික අධීක්ෂණ සැලැස්ම

මේසය මත

1 ඉන්වෙන්ට්‍රි
2 දිනපොත
3 මාසික වාර්තාව
4 අධීක්ෂණ ලිපිගොනුව
5 මාතෘ හා ළමා සෞඛ්‍ය තොරතුරු ලිපි ගොනුව
6 මරණ විමර්ශණ ලිපිගොනුව
7 ත්‍රෛ මාසික කාර්ය සාධන වාර්තාව
8 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියගේ ක්‍රියාකාරී සැලැස්ම ලිපි ගොනුව
9 ක්‍රියාකාරී සැලැස්ම
10 විශේෂ කාර්ය ලිපිගොනුව
11 පෙර පාසැල් සහ පාසැල් සෞඛ්‍ය කටයුතු ලිපිගොනුව

(02) අයාගේ කොට්ඨාශයේ සෞඛ්‍ය සේවා කටයුතු සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම

2.1 සැලසුම් කිරීම

(i) පහත සඳහන් තොරතුරු රැස් කිරීම සහ යාවත් කිරීම

- ➢ කොට්ඨාශයේ වර්ගප්‍රමාණය හා ගම් ලැයිස්තුව
- ➢ ජනගහනය
- ➢ ජීව සංඛ්‍යාති
- ➢ මරණ හා රෝග තත්ව
- ➢ නිෂ්ඛිත සම්පත්

(ii) ගැටළු හා සේවා අවශ්‍යතා හඳුනා ගැනීම

(iii) අදාල ප්‍රදේශයන්ට අදාල වැඩසටහන් සැලසුම් කිරීම සහ ඒවා සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරියේ අනුමැතිය ලබා ගැනීම

(iv) පවුල් සෞඛ්‍ය නිලධාරීන් සහ වැඩසටහන් සැලසුම් කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සැපයීම

(v) සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සමග ත්‍රෛමාසික වැඩසටහන් සමාලෝචනය හා යාවත් කිරීම

2.2 සංවිධානය කිරීම

i රාජකාරි ලැයිස්තුව හා ක්‍රියාකාරී සැලැස්ම

ii පවුල් සෞඛ්‍ය සේවාවට අදාල තොරතුරු රැස්කිරීම

iii තොරතුරු නිවැරදිව වාර්තා කිරීම

iv ඉදිරි කාල සටහන අනුව රාජකාරි කිරීම

v උපකරණ හා අනෙකුත් අවශ්‍ය දේ සැපයීම

vi තම කොට්ඨාශයේ සියළුම සායන සංවිධානය කිරීම

vii මාතෘ හා ළමා සෞඛ්‍ය පවුල් සංවිධාන වැඩසටහන් වලදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සමග කටයුතු කිරීම

vii තම කොට්ඨාශයේ පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීම

viii පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට හා පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට ඔවුන්ගේ රාජකාරි ලැයිස්තුව හා ක්‍රියාකාරී සැලැස්ම ඇති බවට වග බලා ගැනීම

ix පහත සඳහන් කරුණු පිළිබඳව වග බලා ගත යුතුය

- ➢ ඉදිරි කාලසටහන අනුව රාජකාරි කරන බවට
- ➢ කොට්ඨාශයේ පදිංචි බවට හා දෙපාර්තමේන්තු නීති රීති වලට අනුකූලව කාර්යාලය පවත්වාගෙන යන බවට,නිල ඇඳුම් අඳින බවට
- ➢ ලිපිද්‍රව්‍ය උපකරණ හා ඖෂධ ප්‍රමාණවත්ව ඇති බව
- ➢ නියමිත වේලාවට වාර්තා සැපයීම
- ➢ මාසික ප්‍රාදේශීය රැස්වීමට සහභාගීවීම

x වෙනත් දෙපාර්තමේන්තු හා සංවිධාන හා සෞඛ්‍ය කණ්ඩායම සමග සම්බන්ධතාවය

xi අවශ්‍ය අවස්ථාවලදී රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල වෙනත් දෙපාර්තමේන්තුවල වැඩසටහන්වලට සහභාගී වීම

## (03) ඇයගේ කොට්ඨාශයේ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට මග පෙන්වීම ,අධීක්ෂණය හා ප්‍රගතිය ඇගයීම

01 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් සායනවලදී හා ක්ෂේත්‍රයේදී අධීක්ෂණය කිරීම හා මගපෙන්වීම.

02 පරිපාලන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට මග පෙන්වීම හා අධීක්ෂණය.

03 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ කොට්ඨාශයේ සිදුකරන අධීක්ෂණවල ශක්තීන් හා දුර්වල ස්ථාන සාකච්ඡා කිරීම.

04 ගැටළු සාකච්ඡා කර විසඳුම් යෝජනා කිරීම.

05 සහායදායක ලෙස පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ සේවාව සංවිධානාත්මකව හා ගුණාත්මකව ඉටු කරන බවට වග බලා ගැනීම.( ගෘහ පිවිසීම, ගැබිනි මව් ළදරු/ළමා සංරක්ෂණය, පසු ප්‍රසව සංරක්ෂණය, පවුල් සංවිධානය)

06 කාර්යාලයේදී, ක්ෂේත්‍රයේදී සායනයේදී පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනියගේ සේවාව ඇගයීමට ලක් කිරීම.

07 ප්‍රගති සමාලෝචන වාර්තා පැවැත්වීම

## (04) ජාතික සෞඛ්‍ය තොරතුරු පද්ධතිය සුපරීක්ෂණය හා ඇගයීම

01 නිවැරදි හා අදාල දත්ත රැස් කිරීම.

02 පහත සඳහන් කරුණු යටතේ පවුල් සෞඛ්‍ය දත්ත මාසිකව/ත්‍රෛමාසිකව,වාර්ෂිකව ඇගයීම් කිරීම.

- ➢ මාතෘ හා ළමා සෞඛ්‍ය ආවරණය
- ➢ ප්‍රතිශක්තිකරණ ආවරණය
- ➢ පවුල් සංවිධාන ආවරණය
- ➢ පවුල් සෞඛ්‍ය ක්‍රියාකාරකම්
- ➢ සෞඛ්‍ය අධ්‍යාපන කටයුතු

03 මාසික රැස්වීමේදී හා ප්‍රාදේශීය රැස්වීමේදී මෙම දත්ත 3 ඉදිරිපත් කිරීම හා ප්‍රාදේශීය රැස්වීමේදී ප්‍රගතිය බැලීම.

04 ළදරු මරණ විමර්ශණය.

05 මාතෘ මරණ විමර්ශනය

06 මාතෘ හා ළමා සෞඛ්‍ය දත්ත ස්වායීතාවය සෑම නියමිත වෙලාවට වාර්තා සකස් කිරීම හා ඉදිරිපත් කිරීම

07 ත්‍රෛමාසික ප්‍රගති වාර්තාව කාර්තුවකට වරක් ඉදිරිපත් කිරීම

## (05) කාර්ය මණ්ඩල සංවර්ධනය

01 තමාගේ හා තම කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා සංවර්ධනය සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සමඟ කටයුතු කිරීම

03 සේවාස්ථ පුහුණු ඇගයීම

04 අධ්‍යාපන පුහුණු වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

05 සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සමඟ පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියේ වැටුප් වර්ධක, පුහුණු ශිෂ්‍යත්ව, උසස්වීම් දීම සඳහා නිර්දේශ කිරීම

06 පුහුණු මධ්‍යස්ථානවල සේවය කරන මහජන සෞඛ්‍ය හෙද සොයුරියන්, ශිෂ්‍ය හෙද හෙදියන් වලට පුහුණු කළ යුතුය.

## (06) විශේෂිත සේවා සැපයීම

01 ආදර්ශ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම

02 ආදර්ශ පාසැලක් පවත්වාගෙන යාම

03 සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නොමැති විට මාතෘ සායන පවුල් සංවිධාන, සුවනාරී සායන පැවැත්වීම හා අවශ්‍යතා අනුව යොමු කිරීම

04 රුධිර පරීක්ෂණය සඳහා රුධිරය ගැනීම (VDRL GR – RH ,H5%)

05 පවුල් සංවිධාන උපදේශනය, පවුල් උපදේශනය මඳ සරුභාවය පවතින්නේ නම් පරීක්ෂණ සඳහා යොමු කිරීම

06 පාසැල් සෞඛ්‍ය වැඩසටහන් වලට සහභාගි වීම සහ යොවුන් සෞඛ්‍ය සංවාලීමට කටයුතු කිරීම

07 ස්වේච්ඡා සේවකයන් පුහුණු කිරීම පුරා සෞඛ්‍ය වැඩසටහන් සැලසුම් කිරීම

08 බෝවන රෝග හා බෝනොවන රෝග පාලනය සඳහා සෞඛ්‍ය කණ්ඩායමට සහය වීම

09 ආබාධිත පුනරුත්ථාපනය සඳහා එම ආයතන සමඟ කටයුතු කිරීම

10 මුඛ ආබාධ හා හදිසි අනතුරු සඳහා අවශ්‍ය අවවාද දීම හා සේවා සැපයීම

11 දරුවන්ගේ මානසික සංවර්ධනය සඳහා මග පෙන්වීම මානසික ආබාධ සහිතවුවන් යොමු කිරීම සහ ප්‍රජාවේ මානසික සෞඛ්‍ය සංවර්ධනය සඳහා කටයුතු කිරීම

12 පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට පුහුණුවීම් ලබාදීම නිවසේදී දිය හැකි මූලික ගෙද සාත්තුව යන්

13 උපදේශන සේවා සැපයීම

14 කාර්යක්ෂමතා කඩඉම් විභාගය පරීක්ෂක මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කළ යුතුය

## (07) පර්යේෂණ කිරීම

ඉලක්ක කරා ළගා වීම / සේවා අවශ්‍යතා නිර්ණය කිරීම සේවා සැපයීම දියුණු කිරීම සඳහා අවශ්‍ය සරල සමීක්ෂණ හා පර්යේෂණ කිරීම

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ම.සෞ.සේ)

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්